**ගොඩකවෙල ප්‍රාදේශීය සභාව - 2023**

**---------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට ගොඩකවෙල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක  සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව  විගණනයේ කොටසක් ලෙස මා විසින්  විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන  ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | ඉඩමක, ක්‍රීඩාංගනයක හා සංවර්ධන ව්‍යාපෘති 02ක වටිනාකම රු.6,915,318ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | මෙම වරද 2024 වර්ෂයේදී නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් ගත කළ යුතු වේ. |
| (ආ) | සංවර්ධන ව්‍යාපෘති 02ක වටිනාකම රු.165,970ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | - එම - | - එම - |
| (ඇ) | ජීප් රථයක හා මේස වීදුරු 58ක වටිනාකම රු.6,406,235ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |
| (ඈ) | සමාලෝචිත වර්ෂයට අදාළ උපචිත වියදම් රු.39,080ක් ගිණුම්ගත කර නොතිබුණි. | - එම - | - එම - |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ඉඩම් 03ක් රු.700,000ක් ලෙස ගිණුම්ගතකර තිබුණ ද, එම වටිනාකම තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් නොවුණි. | තක්සේරු කරන තෙක් ඒවායේ ඔප්පු වටිනාකම ඉදිරියේදී ගිණුම්ගත කරමි. | සාක්ෂි ඉදිරිපත් කළ යුතු වේ. |

## 1.7 අනුකූල නොවීම

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වර්ෂ 2007 -2021 අතර කාලයට අදාළ රු.1,845,769ක් වූ කල් ඉකුත් තැන්පතු, මුදල් රෙගුලාසි 571(3) අනුව ආපසු ගෙවීමට හෝ රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | මෙම තැන්පත් නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනිමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.11,429,322ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.8,287,136ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,121,029 | 6,505,369 | 7,491,854 | 2,491,610 | 5,935,099 | 6,392,614 | 5,706,053 | 4,107,494 |
| කුලී | 16,890,506 | 13,983,546 | 12,790,137 | 4,741,187 | 16,974,811 | 11,363,452 | 10,111,641 | 3,909,026 |
| බලපත්‍ර ගාස්තු | 1,824,200 | 2,216,388 | 2,216,388 | - | 1,974,000 | 1,909,928 | 1,909,928 | - |
| වෙනත් ආදායම් | 4,659,184 | 2,154,795 | 1,707,976 | 424,582 | 4,780,466 | 1,549,773 | 4345572 | 549,475 |
| | 29,494,919 | 24,860,098 | 24,206,355 | 7,657,379 | 29,664,376 | 21,215,767 | 22,073,194 | 8,565,995 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට රු.2,445,968ක් වූ හිඟ වරිපනම් ශේෂය තුළ වසර 05ට වඩා වැඩි පැරණි රු.681,850ක ශේෂයක් පැවැතිණි. | බදු නොගෙවූවන් වෙත රතු නිවේදන නිකුත් කරන අතර වසර 05ට වැඩි හිඟ මුදල් ජංගම සේවා මඟින් අය කෙරේ. | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.163,099ක් වූ හිඟ අක්කර බදු ශේෂය තුළ වසර 03කට වඩා පැරණි රු.152,244ක ශේෂයක් පැවැතිණි. | අක්කර බදු සතොයක්ෂණයෙන් පසු අයකළ නොහැකි ශේෂ පොත්වලින් ඉවත් කිරීමට සැලසුම් කර ඇත. | හිඟ ආදායම් නොපමාව අය කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 පොදු උපයෝගිතා සේවා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කරන ජල ව්‍යාපෘති දෙකක ජලය බීමට නුසුදුසු බව තහවුරු කර තිබුණ ද, පිරිසිදු කිරීමකින් තොරව තවදුරටත් බෙදාහරිමින් පවතී. | ඒ සඳහා ජල ටැංකි සහ පෙරුම්කාරක උපකරණ සවි කිරීමට ඇස්තමේන්තු සකස් කරමින් පවතියි. | ජලය පිරිසිදු කර බෙදාහැරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.2 ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අනුව මාර්ග හා වැසිජල කාණු නඩත්තු කටයුතු වල ප්‍රගතිය සියයට 15ක තරම් අඩු මට්ටමක පැවතිණි. | ප්‍රතිපාදන නොමැති වීම හා තාක්ෂණ නිළධාරීන්ගේ හිඟය මීට හේතු වී තිබුණි. | පොදු යටිතල පහසුකම් සඳහා ප්‍රමුඛතාව ලබාදිය යුතු වේ. |

### 3.3 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය මෙට්‍රික් ටොන් 2160ක් පමණ බැහැර කිරීම සඳහා 2023 වර්ෂයේදී කාර්යය මණ්ඩල වැටුප්, වාහන සහ යන්ත්‍ර උපකරණ වෙනුවෙන් රු.18,319,269ක් වැයකර තිබුණ ද, එම අපද්‍රව්‍ය අවිධිමත්ව හා පරිසර හිතකාමී ක්‍රමවේදයකින් තොරව බැහැර කර තිබුණි. | ප්‍රමාණවත් පහසුකම් නොමැති වීම මීට හේතු වී තිබුණි. 2024 වර්ෂයේ සිට කසළ ප්‍රතිචක්‍රීයකරණය සිදුකරනු ලබයි. | ඝන අපද්‍රව්‍යය විධිමත්ව කළමනාකරණය කළ යුතු වේ. |

### 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| වර්ෂ 30ක් සඳහා බිම් බදු පදනම මත ලබා දී තිබුණු ඉඩම් කොටස් 02කින් 2023 ජූනි 30 දිනට රු.375,859ක් වූ හිඟ ගාස්තු අයකර නොතිබුණි. ප්‍රමාද ගාස්තු අයකරන ආකාරය ගිවිසුමට ඇතුළත් කර නොතිබීමෙන් 2022 දෙසැම්බර් 31 දිනට පැවති රු.1,852,255ක ප්‍රමාද ගාස්තු කපා හැරීමට සභාව තීරණය කර තිබුණි. | මේ සඳහා නඩු පැවරීමට යොමු කර ඇත. ගිවිසුම්වල ප්‍රමාද ගාස්තුව පිළිබඳ සඳහන් නොවන බව දන්වා ගෙවීම් ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් එම ශේෂය සභා තීරණයක් මත කපා හරින ලදී. | හිඟ අයකර ගැනීමට කටයුතු කළයුතු අතර කුලී ගිවිසුම් විධිමත් කිරීමට කටයුතු කළ යුතු වේ. |

### 3.5 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය අනුකූල නොවන ලෙස, රියදුරන් 06 දෙනෙකු 2024 ජනවාරි සිට 2024 පෙබරවාරි දක්වා කාලය තුළ සේවා ස්ථානයට පැමිණීම පමණක් සටහන් කර තිබුණි. රියදුරන් වෙත අතිකාල දීමනා ගෙවීමේදී ධාවන සටහන්වල සඳහන් වේලාවන් පමණක් අදාළ කරගෙන තිබුණද, එම වේලාවන් හා වාහන ඇතුළුවීම හා පිටවීම සටහන් කරන ලේඛනයේ සඳහන් වේලාවන් අතර පරස්පරතා පැවැතිණි. වාහනය භාවිතා කළ නිලධාරියා වෙනුවට ලේකම් විසින් සියලු ධාවන සටහන් අත්සන් කර තිබුණි. | රියැදුරන් බොහෝ අවස්ථාවලදි බැහැර රාජකාරි සඳහා පිටත්විමේ දී හා ආපසු පැමිණිමේ දී කාර්යාලය වසා ඇති බැවින් මෙවැනි අඩුපාඩු සිදුවී ඇත. ඉදිරියේ දි නියමිත පරිදි පැමිණිම සහ පිටවිම සම්බන්ධයෙන් සටහන් තැබිමට ලිඛිතව දැනුවත් කරන ලදී. | පැමිණීම, පිටවීම සටහන් කිරීම, අතිකාල දීමනා ගෙවීම හා ධාවන සටහන් නඩත්තුව විධිමත් කළ යුතු වේ. |

### 3.6 වාහන පද්ධතිය කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|
| (අ) | බැකෝ යන්ත්‍රය අලුත්වැඩියාව සඳහා 2020 වර්ෂයේ දී භාර දී තිබුණ ද, 2023 ජූලි දක්වාම එය අලුත්වැඩියා කර නොතිබුණි. මේ නිසා එම කාලය තුළ බැකෝ යන්ත්‍ර කුලියට ගැනීමට සිදු වීමෙන් වර්ෂ 2020-2023 ජුනි දක්වා රු.2,984,732ක් ගෙවීමට සිදු වි තිබුණි. | මේ වන විට අළුත්වැඩියා කරමින් පවතියි. යම් යම් අමතර කොටස් සපයා ගැනීමට යාමේ දී සුළු ප්‍රමාදයක් සිදු විය. | අලුත්වැඩියා කටයුතු කඩිනම් කර යන්ත්‍රය ඵලදායී ලෙස උපයෝජනය කළ යුතු වේ. |
| (ආ) | ජීප් රථයක රු.963,920ක අලුත්වැඩියා කටයුතු ඉටු නොකිරිම නිසා 2021 වර්ෂයේ සිට අභාවිතව පවතී. | අවශ්‍ය අමතර කොටස් ලබාගැනීමට කටයුතු කරමින් පවතියි. | වත්කම් අභාවිතව නොතැබිය යුතු වේ. |

### 3.7 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| 2021 පෙබරවාරි 01 දිනැති අංක 03/2020 දරන පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛයට අනුකූල නොවන ලෙස, මාදම්පේ මාළු වෙළඳපොලේ කඩකාමරවලින් ආරක්ෂිත ඇප තැන්පතු රු.840,000ක් අයකර නොතිබුණු අතර කඩකාමර 02ක් ගිවිසුම් රහිතව බදු දී තිබුණි. එමෙන්ම, කඩකාමර 22කින් හා ගබඩා කාමර 07කින් හිඟහිටි රු.2,051,100ක් 2023 දෙසැම්බර් දක්වා අයකර නොතිබුණු අතර ඉන් ගබඩා හා කඩ කාමර 11ක් නැවත පවරා ගෙන තිබුණි. | හිඟ මුදල් අය කිරීම අඛණ්ඩව කෙරේ. හිඟ තැන්පතු මුදල් ද ඉදිරියේදී අය කරමි. | හිඟ කුලිය හා තැන්පත් මුදල් අය කළයුතු වේ. |

## 3.8 දෘශ්‍ය අක්‍රමිකතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගැබිණි මව්වරුන්, වැන්දඹු කාන්තාවන් හා ආබාධිතයින් වෙනුවෙන් සුභසාධන වැඩසටහන් 05ක් ක්‍රියාත්මක කර තිබුණි. මේ සඳහා ප්‍රතිලාභීන් තෝරාගත් ආකාරය හා ලබාදුන් ද්‍රව්‍යාධාර පිළිබඳ තොරතුරු කිසිවක් නොතිබීම නිසා ලබාදුන් ද්‍රව්‍යාධාර ප්‍රතිලාභීන් වෙත ලැබුණිද යන්න අවිනිශ්චිත විය. එමෙන්ම, රු.97,585ක ද්‍රව්‍ය සඳහා ව්‍යාජ බිල්පත් ඉදිරිපත් කර තිබුණි. | ප්‍රතිලාභීන් තෝරාගැනීම විධිමත්ව සිදුකර ඇත. එහෙත්, ගෙවීම් කිරීමේදී ගැටලුකාරී තත්ත්වයක් තිබුණු බැවින් මූලික විමර්ශනයක් සිදු කරමින් පවති. මේ නිසා අවශ්‍ය තොරතුරු පරීක්ෂණ අවසන් වූ පසු ලබාදිය හැක. | වැඩසටහන් ක්‍රියාත්මක කිරිමේදි යහපත් අභ්‍යන්තර පාලනයක් තිබිය යුතු වේ. අනාවරණය වී ඇති දෝෂ සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කළ යුතු වේ. |

## 3.9 කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රක්වාන නගරයේ ළමා උද්‍යානය ඉදිකිරීමේදී ඇස්තමේන්තුගත පිරිවැය රු.533,936කින් ඉක්මවා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. එමෙන්ම, වැඩ විෂයයන් 04ක් සඳහා රු.198,535ක් වැඩිපුර ගෙවා තිබුණි. | පළාත් ඉංජිනේරු උපදෙස් පරිදි ගෙවීම් කරන ලද අතර වැඩිපුර ගෙවා ඇති රු.50,812ක් රඳවුම් මුදලින් අඩුකර ගනිමි. | වැඩිපුර ගෙවීම් අයකළ යුතු වේ. |
| (ආ) | බලවින්න මීගහමඩයාය මාර්ගයේ ඉටුනොකළ වැඩ වෙනුවෙන් රු.90,000ක් ගෙවා තිබුණි. | ඇස්තමේන්තු සැකසීමේදී අඩුපාඩු සිදු වී ඇත. බිල්පතේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩ ඉටුකර තිබුණි. මේ නිසා සභාවට පාඩුවක් සිදු වී නැත. | වැඩිපුර ගෙවීම් ආපසු අයකළ යුතුවේ. |
| (ඇ) | අල්පිටිය උල්පත මාර්ගය ඉදි කිරීමේදී කොන්ක්‍රීට් පිළිබඳ තත්ත්ව පරීක්ෂාවන් සිදු නොකර ඒ සඳහා රු.1,711,356ක් ගෙවා තිබුණි. | විගණනයෙන් පෙන්වා දුන් පසු එම වරද නිවැරදි කර ගනිමි. | තත්ත්ව පරීක්ෂා සිදුකළ යුතු වේ. |
| (ඈ) | මාර්ග සකස් කිරීමේදී වැඩිපුර ගෙවීමත්, ව්‍යාපෘති 03ක් සඳහා සිමෙන්ති වැඩිපුර ලබා දීමත් නිසා රු.98,586ක පාඩුවක් සිදු වී තිබුණි. | JCB යන්ත්‍ර පැයක මිල ඉහළ ගොස් තිබීමත්, කොන්ක්‍රීට් මිශ්‍ර කිරීමේදි සිමෙන්ති යොදා ගන්නා ප්‍රමාණ වෙනස් වීමත් මෙම වැඩිපුර ගෙවීමට හේතු වී තිබුණි. | වැඩිපුර ගෙවීම ආපසු අයකළ යුතු වේ. |